2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

540 A

දෙහිවල බටහිර



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 540 A - දෙහිවල බටහිර

## ග්‍රාම සංවර්ධන සැලැස්ම



ආර්ථික සං

පිටු අංක

ආර්.වී.ඩී.එ

1. පිහිටීම 01

2. වසමේ සිතියම 01

3. සමාජීය හා සංස්කෘතික කරුණු 02-03

4. යටිතල පහසුකම් සංවර්ධනය (මාර්ග, කාණු, ඇල මාර්ග, පාලම් 04-08

5. සමාජ සංවර්ධන සැලැස්ම 09-14

6. නිපුනතා සංවර්ධන හා හැකියා වර්ධනය කිරීම 15

7. ජීවනෝපාය සංවර්ධනය සහ ව්‍යවසාය සංවර්ධන සැලැස්ම 16-18


8. කෘෂිකර්ම සැලැස්ම 19

9. පරිසර කලමනාකරණ සැලැස්ම 20-24


## 01.පිහිටීම

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත්, වසම් 15 අතරින් දෙහිවල බටහිර වසම උතුරු දෙසින් වාසල ඇළටත්, ඊසාන දෙසින් ගල්වල වසමටත්, ගිණිකොන දෙසින් දෙහිවල නැගෙනහිරටත්, දකුණින් ජයතිලක වසමටත්, බටහිරින් මුහුදු තීරයට මායිම්ව වර්ග කිලෝමීටර් 0.48 ක් පුරා විසිරී ඇත.

## 02.වසමේ සිතියම



## 03.සමාජයීය හා සංස්කෘතික කරුණු

540 ඒ, දෙහිවල බටහිර වසම අධිනාගරික ප්‍රදේශයක් වන අතර, මෙම වසම තුළ විවිධ ජාතීන් නියෝජනය කරමින් සහජීවනයෙන් ජනකොට්ඨාසයන් ජීවත් වේ. මිශ්‍ර සංස්කෘතියක් දැකිය හැක. වැඩි ජනගහනයක් මහල් නිවාස ආශ්‍රිතව ජීවත් වේ. නිවාස සංකීර්ණ 72 ක් පමණ දැකිය හැක. මහල් නිවාස ආශ්‍රිතව මැලේ, මුස්ලිම්, ඉන්දියානු දෙමළ, මාලදිවයින්, බර්ග වැනි විවිධ ජනවර්ග තාවකාලික විසා බලපත්‍ර සහිතව රැඳි සිටියි. ද්විත්ව පුරවැසිභාවය සහිත පුද්ගලයන් මෙරට මහල් නිවාස කුලියට දී විදේශ රටවල පදිංචිව ඇත.

දෙ/බටහිර වසම තුළ රාජ්‍ය ආයතන ලෙස සමස්ථ දෙහිවල ප්‍රජාවටම සේවය සලසන දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, දෙහිවල මධ්‍ය පුස්තකාලය, ද්විතික පාසලක් වන බප/පිළි ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමය, ඉංග්‍රිසි මාධ්‍යයෙන් කටයුතු කරන ශ්‍රී සදහම් දහම් පාසැල, රාජ්‍ය හා පෞද්ලික බැංකු, මූල්‍ය ආයතන, විහාරස්ථාන 2 ක්, ක්‍රිස්තියානි පිබිදීමේ සභාව, ක්‍රිඩාංගනයක්, හා ළමා උද්‍යානයක්, දෙහිවල පෙයාලයින් පාර අවසානයේ සිට වාසල පාර අවසානය දක්වා ඇති මීටර් 750 ක් පමණ දිග ස්වභාවික වෙරළ තීරයක්, වසමට මායිම්ව මුහුදට ගලා බසින ප්‍රධාන ඇළ මාර්ගයක් ද දක්නට ඇත.

වසම තුළ ජීවනෝපාය ක්‍රම යටතේ තම ජීවිතය පවත්වාගෙන යන බහුවිධ පිරිසක් මෙහි දක්නට ලැබේ. තම ශ්‍රමය කැපකර ආදයම් උත්පාදන මාර්ගවල නිරත වෙන පිරිස් දක්නට ලැබේ. වෘත්තිමය වශයෙන් ධීවර වෘත්තිය හා කිමිදුම්කරණයේ නියත වෘත්තිකයන් දැකිය හැක. ඔවුන් විසින් විදේශිය විසිතුරු මත්ස්‍ය අපනයන වෙළඳපොල සදහා විසිතුරු මසුන් ඇල්ලීම සිදු කරයි. වෙළද ආර්ථික ක්‍රමයක් හා සංචාරක කෙෂත්‍රය ආශ්‍රිතව රැකියා කරන්නන් (රෙස්ටුරන්ට්, ලැගුම්හල්) දැකිය හැක. තවද මෙම වසම තුළ වැඩිම විශ්‍රාම වැටුප් ලබන 450 ක් පිරිසක් ඇත.

- **මූලික තොරතුරු**

| | | ස්ත්‍රී | පුරුෂ | එකතුව |
|---|---|---|---|---|
| පුද්ගල සංඛ්‍යාව | = | 3952 | 3836 | 7788 |
| පවුල් සංඛ්‍යාව | = | 1947 | | |

| | | |
|---|---|---|
| සමෘද්ධිලාභි පවුල් සංඛ්‍යාව | - | 15 |
| වැඩිහිටි දීමනා ලබන පවුල් සංඛ්‍යාව | - | 05 |
| ආබාධිත දීමනා ගන්නා පවුල් සංඛ්‍යාව | - | 03 |

**<u>නිවාස</u>**

| | | |
|---|---|---|
| ස්ථිර නිවාස | - | 1525 |
| අනවසර නිවාස | - | 06 |
| රෙස්ටුරන්ට් | - | 26 |
| ලැගුම් හල් | - | 10 |

<u>ආගමික ස්ථාන</u>

පන්සල් - 02

ක්‍රිස්තියානි පල්ලි - 01

භාවනායෝග මධ්‍යස්ථාන - 01

පාසැල් - 01

- **වසමේ විදි**

| වීදියේ නම | **විදි අංකය** |
|---|---|
| ගාලු පාර | ඉරට්ටේ අංක 2-166 දක්වා |
| වාසල පාර | අංක 1-39 දක්වා |
| මෙල්පඩ් චන්දවංක | අංක 1-51 දක්වා |
| එබනිසර් පෙදෙස | අංක 1-38 දක්වා |
| පළමුවන පටුමග | අංක 1-31 දක්වා |
| ප්‍රේසර් මාවත | අංක 1-60 දක්වා |
| රාමනාදන් මාවත | අංක 1-25 දක්වා |
| රත්නාකර පෙදෙස | අංක 1-73 දක්වා |
| ඉනිෂියම් පාර | අංක 2- 47/1/ඒ දක්වා |
| ඇල්බට් පෙදෙස | අංක 1-52 දක්වා |
| කැම්බල් පෙදෙස | අංක 1-31 දක්වා |
| 2 වන පටුමග | අංක 1-57 දක්වා |
| පීටර්ස් පටුමග | අංක 1-57/1 දක්වා |
| මුහන්දිරම් පටුමග | අංක 1-62 දක්වා |
| වැන්ඩවට් පෙදෙස | අංක 1-55 දක්වා |
| ඉනර් වැන්ඩවට් පෙදෙස | අංක 1-46 දක්වා |
| වින්ඩසර් මාවත | අංක 1-41 බී |
| ද අල්විස් පෙදෙස | අංක 1-58/2 දක්වා |
| ඈනී මාවත | අංක 1-25 ඒ දක්වා |
| පෙරේරා මාවත | අංක 1-14 දක්වා |
| ෙෆයාලයින් පාර | අංක 1-26 දක්වා |
| ඇතුළත ෙෆයාලයින් පාර | අංක 1-47/7 ඒ දක්වා |

## 04.යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන සැලැස්ම

| ගැටලුව | අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම | කාලය | ප්‍රතිලාභී පවුල් | වගකීම |
|---|---|---|---|---|---|---|
| මාර්ග , කාණු, බෝක්කු අබලන් වීම නිසා එදිනෙදා කාර්ය සඳහා වැයවන කාලය හා ප්‍රමාදය ගමනාගමනය අපහසු වීම. ප්‍රධාන පාරවන ගාලුපාරට පිවිසීම අසිරු වීමත්, මාර්ග තදබදය වැඩිවීම. | උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝකාලින පැවැත්මක් සහිතව මාර්ග පද්ධතියක් සැකසීම. | දෙ/ග මහනගර සභාවේ ප්‍රධාන ඉංජිනේරු , තාක්ෂණ නිලධාරි | • **වින්සර් ඇවනියු නො. 3-1/3 සී දක්වා කාපට් කිරීම හා කාණු පද්ධතිය සකස් කිරීම.**<br>**පළල අඩි -12 දිග - මීටර් 250**<br>**වර්තමාන තත්ත්වය -** තාර තැනින් තැන ගැලවී බොරළු සහිත පාරක් දැකිය හැක. කාණුවෙන් ද වතුර බැස නොයයි. මුලින් කාණුව සාදා පාර කාපට් කල යුතුය. | 03 | 25 | දෙ/ගල්කිස්ස නගර සභාව |
| | | ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තාක්ෂණ නිලධාරි | • **මුහන්දිරම් පටුමග නො.1-62 දක්වා මාර්ගය කාපට් කිරීම හා කාණු පද්ධතිය ගැඹුරු කිරීම.**<br>**පළල අඩි - 12 දිග - මීටර් 450**<br>**වර්තමාන තත්ත්වය -** තාර තැනින් තැන ගැලවී ඇත. මෙම පටුමගෙහි OCEAN BEACH HOTEL ඉදිරිපිටින් වතුර බැසීම සිදු වෙයි. එම ස්ථානයෙන් වතුර බැසීම නිසියාකාරව සිදුවන්නේ නැත. | 03 | 65 | දෙ/ගල්කිස්ස නගර සභාව |
| වර්ෂා කාලයේ දී කාණු පද්ධති අබලන් වීම නිසා සුළු වර්ෂා කාලයක දී පවා ගංවතුර ඇති වී මාර්ග හා නිවාස යටවීම. | වර්ෂා ජලය විධිමත්ව බැස යන ලෙස කාණු පද්ධතිය සැකසීම. | PRDA/UDA තාක්ෂණ නිලධාරි මගින් මාර්ග හා කාණු පරීක්ෂා කර | • **පීටර්ස් පටුමග නො. 1-54 දක්වා කාපට් කිරීම හා කාණු පද්ධතිය ශුද්ධ පවිත්‍ර කර සංවර්ධනය කිරීම.**<br>**පළල අඩි -15 දිග - මීටර් 470** | 03 | 85 | දෙ/ගල්කිස්ස නගර සභාව |
| | | | • **පීටර්ස් පටුමගෙහි වතුර ගලා යන රේල් පාර අසල ඇති බෝක්කුව පහත් කර සංවර්ධනය කිරීම.**<br>**වර්තමාන තත්ත්වය-** තාර තැනින් තැන ගැලවී ඇත. | 03 | 175 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ගැළපෙන ක්‍රමවේදයන් යටතේ දිගුකාලීන පැවැත්මක් සහිතව කාලරාමුවකින් මාර්ග හා කාණු පද්ධති සකස් කිරීම. | පීටර්ස් පටුමගෙහි ඇති කාණුවල වැලි පිරීම නිසා වතුර බැස නොයයි. නො.46 STYLE LANKA නිවාස සංකීර්ණය ඉදිරිපිට පැය 24ක ට වැඩි අධික කාලයක් තුල වතුර බැස නොයෑම නිසා ජනතාව ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇත. වතුර බසින බෝක්කුව කාණුවට වඩා උසයි. වතුර රැදීම නිසා මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවය වැඩි වී ඇත. | | | දෙ/ගල්කිස්ස නගර සභාව |
| | | | • **ඇනී මාවත (ගාලුපාරෙන් පටන් ගන්නා අංක162 B1 - 25A) දක්වා කාපට් කිරීම.**<br>**දිග - මීටර් 250 පළල - අඩි 15**<br>**වර්තමාන තත්ත්වය -** ඇනී මාවත දැනට තාර තැනින් තැන ගැල වී අබලන් වී ඇත. | 03 | 58 | දෙ/ගල්කිස්ස නගර සභාව |
| | | | • **අල්විස් පෙදෙසෙහි නො. 25-33 දක්වා තාර දමා සංවර්ධනය කිරීම.**<br>**පළල අඩි- 20 දිග - මීටර් 250**<br>**වර්තමාන තත්ත්වය -** දැනට තාර තැනින් තැන ගැලවී ඇති අතර, නිවාස සංකීර්ණ ඉදිකිරීම් පවතින නිසා පාර අබලන් වී ඇත. | 03 | 125 | දෙ/ගල්කිස්ස නගර සභාව |
| | | | • **පෙරේරා පටුමග නො. 146 A – NO. 57/1 දක්වා තාර දැමීම හා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.**<br>**පළල අඩි- 08 දිග- මීටර් 150**<br>**වර්තමාන තත්ත්වය -** මෙහි කාණු පද්ධතිය අබලන් වී ඇති අතර, අවට මදුරුවන් වැඩියෙන් බෝවීමක් දක්නට ඇත. තාර තැනින් තැන ගැලවී පාර අබලන් වී ඇත. | 03 | 15 | දෙ/ගල්කිස්ස නගර සභාව |
| | | | • **2nd lane පටුමගෙහි අජිත් ඔටෝ ඉංජිනියරින්** | 03 | 875 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | **ඉදිරිපිට ඇති කාණුවෙහි පැති බිත්තිය ප්‍රතිසංස්කරණය කිරීම හා කාණුව ශුද්ධ පවිත්‍ර කිරීම.**<br>**වර්තමාන තත්ත්වය -** $2^{nd}$ lane පටුමගෙහි අජිත් ඔටෝ ඉංජිනියරින් ඉදිරිපිට ඇති කාණුවේ වතුර රැඳීමක් නිරන්තරයෙන් දැකිය හැකි අතර, මදුරුවන් බෝවීමේ අවදානමක් දැකිය හැක.<br><br>• **වැන්ඩවට් පාරේ කාණු පද්ධතිය සකස් කිරීම. (ඉනර් වැන්ඩවට්, වින්සර් ඇවනියු ඇතුළු**<br>**වර්තමාන තත්ත්වය-** වැන්ඩවට් පාර කාපට් කිරීමෙන් ඵලදායි නැත. කාණු පද්ධතිය ගැඹුර කර සැදිය යුතු අතර,වැසි දිනවල දී එම ප්‍රදේශයේ මාර්ගය හා ඉනර් වැන්ඩවට් හී නිවාස අංක (නො. 15/බී,11,19,32) නිවාස කිහිපයක වතුර දැමීමක් දැකිය හැක. තවද වැන්ඩවට් පාරෙහි Nexus court නිවාස සංකිර්ණය ඉදිරිපිට පාර ගිලා බැස ඇත.<br><br>• අල්විස් පෙදෙසෙහි ඇති මහ කාණුව සංවර්ධනය කිරීම. (විශාල කියුබ් පයිප්ප දමා ජලය මුහුදට ගලාබැස්සීම. මෙහිදී බාධකයක් යොදා පයිප්පය වැලිවලින් ගොඩනොවන පරිදි සකස් කිරීම)<br>**වර්තමාන තත්ත්වය -** අල්විස් පෙදෙසෙහි ඇති මහ කාණුවෙන් ජලය මුහුදට බැස නොයෑම නිසා ෆ්‍රේෂර් මාවතෙහි සිට වැන්ඩවට් පෙදෙස දක්වා ඇති මාර්ග වැසි ජලයෙන් යටවීම. අල්විස් පෙදෙසෙන් වතුර බසින ඇළ මාර්ගය දුම්රිය පාර දක්වා මුහුදට සම්බන්ධ වේ. මෙහිදී මුහුදට සම්බන්ධ වන කොටස මුහුදු වැලි නිසා ගොඩවීම හේතුවෙන් මාර්ග සුළු වැස්සක දී පවා | 03<br><br>අවු 01 | 675<br><br>194 7 | දෙ/ ගල්කිස්ස නගර සභාව<br><br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව<br><br>දුම්රිය දෙපාර්තමේන්තුව<br><br>දෙ/ගල්කිස්ස නගර සභාව<br><br>ප්‍රා.ලේ.කා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ගංවතුර තත්ත්වයක් දැකිය හැක. තවද වෙරළ තීරය අපවිත්‍ර වී ඇත. තට්ටු නිවාස වලින් විසිකරන ලද අපද්‍රව්‍ය බොහොමයක් මෙම කාණුව හරහා වෙරළ තීරයට පැමිණේ. ඉවතලන ද්‍රව්‍ය වල වතුර රැදීමෙන් මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවය වැඩිය. | | | දෙ/ග නගර සභාව |
| | | | • **ප්‍රේෂර් මාවතෙහි කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම.**<br>**වර්තමාන තත්ත්වය-** කාණු පද්ධතිය පටු වන අතර, එය පළල් කර ගැඹුර කළ යුතුය. නො.32 නිවස අසල වතුර රැදීමක් දැකිය හැක. වතුර බැසීම නිසියාකාරව සිදුවන්නේ නැත. | 03 | 52 | දෙ/ග නගර සභාව |
| | | | • **දෙ/බටහිර වසමෙ ඇති සියලු කාණු ශුද්ධ පවිත්‍ර කල යුතුය.**<br>**වර්තමාන තත්ත්වය -** කාණු වල ප්ලාස්ටික් බෝතල්, විවිධ කැළි කසල, ඉටි බෑග්, වැලි පිරීම්, අනවශ්‍ය ගස් වැවීම ආදිය දැකිය හැක. වතුර රැදීම් නිරන්තරව දැකිය හැක. ( දෙවන පටුමග, පීටර්ස් පටුමග, කැම්බල් පෙදෙස, ප්‍රේෂර් ඇවනියු, අල්විස් පාර, නිමන්තරාජපක්ෂ මාවත යන පෙදෙස් වල කාණු පද්ධති නිරන්තරයෙන් ශුද්ධ කළ යුතුය) | 06 | 194<br>7 | දෙ/ග නගර ස<br>භාව |
| රජයේ නිලධාරීන් සදහා වසමේ නිශ්චිත ස්ථානයක් | රාජ්‍ය නිලධාරීන් හා | සියලු | • ප්‍රේෂර් ඇවනියු හි පිහිටා ඇති ක්‍රිඩාපිටියට අනුබද්ධව එම ස්ථානයේම ග්‍රාම නිලධාරි කාර්යාලයක් ඉදි කිරීම.<br>**වර්තමාන තත්ත්වය -** වසම තුළ ග්‍රාම නිලධාරි කාර්යාලයක් නොමැති වීම නිසා ග්‍රාම නිලධාරි | අවු01 | 194 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නොමැති වීම නිසා මහජනතාවට වසමෙ නිලධාරින් සමග එකම ස්ථානයක හමු නොවීම නිසා රාජකාරි කරගෙන යාමේදී අපහසු වීම. | සේවාලාභින්ට එකම ස්ථානයක පහසුකම් සැලසීම. | රාජ්‍ය නිලධාරීන් ට හා සේවාලාභී න්ට පහසුකම් සහිත සේවා මධ්‍යස්ථා නයක් ඉදිකිරීම. | කාර්යාලය දෙ/නැගෙනහිර හිල්ඩා මහල් හි පවත්වාගෙන යයි. | | 7 | |

## 05.සමාජ සංවර්ධන සැලැස්ම

| ගැටලුව | අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | කාලය | ප්‍රතිලාභී පවුල් | වගකීම |
|---|---|---|---|---|---|---|
| සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම.<br><br>වැසිකිළිවලවල් උතුරා යෑම.<br><br>540 ඒ බටහිර වසමේ නිමන්ත රාජපක්ෂ මාවතේ 120/8 සිට 120/22 දක්වා නිවෙස් හිමියන්ගේ නිවෙස් මුහුදු මට්මට ආසන්නයේ පිහිටීම නිසා වැසිකිළිවලවල් ගැඹුරට හෑරීමට නොහැකිව වතුර පිරෙයි. වැසිකිළිවලවල් සඳහා 1 වළල්ලක් පමණයි දැමීමට පුළුවන. වැසි කාලයේ දී 3න් වතාවක් පමණ වළවල් ශුද්ධ කිරීමට සිදුව ඇත. පවුලකට මාසිකව සෑෙහන මුදලක් වැයවේ.<br><br>සෞඛ්‍ය අතින් ද අනාරක්ෂිත වේ. වැසි දිනවලදී උණහැදීම, මදුරුවන් | විධිමත් සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම. | මලපවාහන මණ්ඩලය මගින් විධිමත් ඉදිකිරීම් නියාමනය කිරීම.<br><br>මහජන සෞඛ්‍ය පරීක්ෂක, ප්‍රා.ලේ.කා තාක්ෂණ නිලධාරි හා දෙ/ග තාක්ෂණික නිලධාරීන්ගේ උපදෙස් ක්‍රියාවට නැංවීම. | • අබලන් තත්ත්වයේ ඇති අඩු ආදායම් ලාභී පවුල්වල වැසිකිළිවලට මුල්‍ය ආධාර හා ද්‍රව්‍යමය ආධාර ලබාදීම.<br>• ආබාධි අය සඳහා වැසිකිළි ඉදිකිරීමට මුල්‍ය ආධාර ලබාදීම.<br><br>• මලපවාහන පද්ධතියක් සාදා දීම. ඒ සඳහා<br><br>120/ඒ හි හිස් ඉඩමේ කොටසක් රජයට අයත් බිම් තිරුවක් ඇති බවට නිවැසියන් පවසයි. එම වත්ත අයිනෙන් වැන්ඩවට් පෙදෙසෙ ඇති ගලියට යොමු කල හැකි බවට .<br><br>**තවත් විකල්පයක් වශයෙන්**<br>නිමන්ත රාජපක්ෂ මාවතේ වත්ත ඇතුළෙන් තිබෙන කාණු පද්ධතියෙන් පෙරේරා පටුමගට සම්බන්ධ කල හැකිය. | මස 03<br><br>අවු 01 | 06<br><br>28 | සමෘද්ධි සංවර්ධන නිලධාරි<br><br>සමාජසේවා නිලධාරි<br><br>මලපවාහන මණ්ඩලය<br><br>ප්‍රා.ලේ.කා<br><br>ග්‍රාම නිලධාරි<br><br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br><br>සංවර්ධන නිලධාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| බෝවීම සිදුවේ. | | | | | | |
| ක්‍රීඩා හා විනෝදාස්වාද ක්‍රියාකාරකම් අඩුවීම නිසා බෝනොවන රෝග වැඩිවීම. (හෘද රෝග, අධික රුධිර පීඩනය,දියවැඩියාව, සහ විවිධ පිළිකාවලට ඇති අවදානම වැඩිවීම.) | නිරෝගී ජීවිතයක් සඳහා කායික හා මානසික සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහිකිරීම. | ක්‍රීඩා නිලධාරි තරුණ සේවා නිලධාරි හරහා ක්‍රීඩා අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන තරුණ තරුණියන් සඳහා වැඩපිළවෙලක් සකස් කිරීම. | ක්‍රීඩා කෞශල්‍ය ඇති ළමයින් හඳුනා ගැනීම.<br><br>ශාරීරික ව්‍යායාම සඳහා වැඩිහිටියන් සහ ළමුන් යොමු කිරීම.<br><br>• ප්‍රේෂර් ඇවනියුහි පිහිටා ඇති ක්‍රීඩාපිටිය හා ළමා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම.<br><br>• ප්‍රේෂර් ඇවනියු හි පිහිටා ඇති ළමා උද්‍යානයේ ඇති යකඩ සෙල්ලම්බඩු ඉවත් කර පයිබර් වලින් තැනූ ක්‍රීඩා භාණ්ඩ ලබාදීම. | මාස 3 | 1947 | දෙ/ග නගර සභාව<br><br>තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය |
| ළමුන්ට ප්‍රමාණවත් පරිදි පාසැලෙහි පහසුකම් නොමැති වීම. | විශිෂ්ට පුරවැසියන් සමාජගත වීම. | ප්‍රාදේශිය ඉංජිනේරු පාසැල් සංවර්ධන සමිති , කලාප කාර්යාලය, අධ්‍යාපන අමාත්‍යාංශය හා මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කර පාසැල් ළමුන් සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම. | • ප්‍රමාණවත් ගුරු මණ්ඩලයක් පවත්වා ගැනීම.<br>• දැනට බප/ පිළි ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ ළමුන් 40ක් සඳහා පරිගනක 08 ක් පමණයි. පරිගනක යන්ත්‍ර අවශ්‍ය ඇත.<br><br>• Phto copy යන්ත්‍රයක් | මාස3 | ළමුන් 425 | කලාප අධ්‍යාපන කාර්යාලය<br><br>අධ්‍යාපන දෙපාර්තමේන්තුව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| වැඩිහිටියන් සමාජයෙන් හුදකලා වීම. | වැඩිහිටි ප්‍රජාව සක්‍රිය සමාජ ක්‍රියාකාරකම්වල යොමු කිරීම. | වැඩිහිටි ප්‍රජාව සවිබල කර සමාජ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ කරගත හැකි වැඩසටහන්වලට යොමු කිරීම. | • දෙහිවල බටහිර වසම තුළ වැඩිහිටි සමිතියක් නොමැත .වසම තුළ වැඩිහිටි ප්‍රජාව එක්රුස් කර ප්‍රා.ලේ. කාර්යාලයේ සමාජ සේවා නිලධාරි සමග එකතු වී වැඩිහිටි සමිතියක් ආරම්භ කිරීම.<br>• සමාජ සේවා කටයුතු සඳහා වැඩිහිටියන් යොමු කර ගැනීම. | මාස 3 | | සමාජ සේවා නිලධාරි |
| තරුණ හා ළමා පරපුර මත්ද්‍රව්‍යවලට යොමු වීම. | මත්ද්‍රව්‍ය භාවිතයෙන් තරුණ පරපුර අවම කරගැනීම. | විධිමත් පුහුණුවලත් ආයතන හා පුද්ගලයින් සම්බන්ධ කිරීම. (රාජ්‍ය හා රාජ්‍ය නොවන)<br><br>ජාතික ළමා | • මත්ද්‍රව්‍ය භාවිතා කරන පවුල් හඳුනා ගැනීම හා හඳුනාගත් පවුල් සමග සාකච්ඡා කිරීම.<br>• එම පවුල් සඳහා පෞද්ගලික හා පොදු උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• වසම තුළ ඇති මත්ද්‍රව්‍ය කමිටු මගින් ඒවා තුළින් මත්ද්‍රව්‍යවලට වාඩාත් නැඹුරු වූවන් සොයාබලා පුනරුත්ථාපනයට කැමති පුද්ගලයින් යොමු කිරීම. | | | අන්තරයාක නිවාරණ මණ්ඩලය මත්ද්‍රව්‍ය නිවාරණ පුහුණු කිරීම් හා මත්ද්‍රව්‍ය ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීමේ නිලධාරීන්<br><br>මත්ද්‍රව්‍ය කමිටු සාමාජිකයන්<br><br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ළමා අපයෝජනයට වාර්තාගත නොවන පිරිස් හඳුනාගැනීම. | අපයෝජනයට ලක්වූවන් මුදවා ගැනීම. | ආරක්ෂක අධිකාරිය හා ළමා හා කාන්තා අමාත්‍යාංශයේ නිලධාරින් හා වසම් මට්ටමෙන් සිවිල් ආරක්ෂක කමිටු සමග සාකාච්ඡා කර සැලැස්මක් සකස් කිරීම. | • කුට්ටනයට හසුවූ දරුවන් පුනරුත්ථාපනය කිරීම හා මනෝඋපදේශනයට යොමු කිරීම.<br>• ළමුන් හඳුනාගෙන පරිවාස හා ළමා ආරක්ෂක නිලධාරියාට යොමු කිරීම.<br>• අවදානම් සහිත පවුල් හඳුනාගෙන දෙමාපියන් දැනුවත් කිරීම.<br>• දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන්වලට යොමු කිරීම.<br>• ළමා අයිතිවාසිකම් පිළිබඳ යම් ගැටලුවක් ඇති වූ අවස්ථාවක දී 1929 ශ්‍රී ලංකා ළමා දුරකථන සේවය සම්බන්ධ කර ගැනීම. | | | නිලධාරි.<br>වසමේ සිවිල් ආරක්ෂක නිලධාරීන් |
| **සෞඛ්‍ය හා පෝෂණ ගැටලු**<br>ගර්භණී මව්වරුන්ගේ ගැටලු පාසැල් ළමුන්ගෙ සහ අවු.5 ට අඩු බර සහිත ළමුන්ගේ පෝෂණ ගැටලු | වසම තුළ පෝෂණ ගැටලු අවම කිරීම හා නිරෝගිමත් සෞඛ්‍ය සම්පන්න පුරවැසියෙක් බිහිකිරීම. | වසමෙහි පවුල් සෞඛ්‍ය නිලධාරි මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි මුල්ළමාවිය සංවර්ධන නිලධාරින් සමග වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. | • අඩු බරැති ළමුන්ට ත්‍රිපෝෂ ලබාදීම.<br>• මාතෘ සායන සඳහා සහභාගි නොවන මව්වරුන් සහ ළමයින් යොමුකිරීමට උනන්දු කිරීම. | මාස 03 | 12 | පවුල් සෞඛ්‍ය නිලධාරි<br>ග්‍රාම නිලධාරි<br>ආර්ථික සංවර්ධන නිලධාරි<br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br>මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආගමික ස්ථානවල අඩු පහසුකම් | අංග සම්පූර්ණ පන්සලක් කිරිම. | කොට්ඨාසයේ දායක සභාවගේ සහභාගිත්වයෙන් හා බෞද්ධ කටයුතු නිලධාරින් සමග වැඩසටන් ක්‍රියාත්මක කිරිම | • අවු.5 ට අඩු බරැති ළමුන් මාතෘසායනවල පෝෂණ මට්ටම ඉහළ නැංවීමේ වැඩසටහන් වලට නිතර යොමු කිරීම.<br><br>• නිවැරදි හා පෝෂණ ගුණයෙන් යුත් ආහාර රටාවන්වලට දරුවන් හුරුකිරීම.<br><br>• දෙ/බටහිර ආර්යාරාම විහාරස්ථානයෙහි භික්ෂුන් වහන්සේලාට නතර වීමට සංඝවාසයක් නොමැත. ඒ සඳහා සංඝාවාසයක් හා දානශාලවක් ඉදිකිරීම. | අවු 01<br><br>අවු 01<br><br>මාස 6 | වැඩ සිටින භික්ෂුන් 04<br><br>වැඩ සිටින භික්ෂුන් 07<br><br>සිසුන් 175 | දායක සභාව<br><br>බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරින්<br><br>දායක සභාව<br><br>බෞද්ධ කටයුතු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දහම්පාසැල්වල අඩු පහසුකම් | විධිමත් ලෙස දහම්පාසැලක් පවත්වාගෙන යෑම. | . | • බෝධිය වටා ප්‍රකාරයක් සෑදීම.<br><br>• දෙ/බටහිර ආනන්ද ධර්මරාජ විහාරයේ බුදු පිළිම වටේ ප්‍රකාරයක් සෑදීම.<br><br>• ආනන්ද ධර්මරාජ විහාරයේ ඉංග්‍රිසි මාධ්‍යයෙන් පවත්වාගෙන යන දහම් පාසැලේ පංති කාමර වෙන්කර නැත. ඒවා පාටිෂන් කර වෙන් කළ යුතුය.<br><br>• පුහුණු ගුරු මඩුල්ලක් පවත්ගෙන යා යුතුය. | | | දෙපාර්තමේන්තුවේ නිලධරින් |

## 06.නිපුණතා සංවර්ධනය හා හැකියා වර්ධන සැලැස්ම

| ගැටලුව | අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම | කාලය | ප්‍රතිලාභී පවුල් | වගකීම |
|---|---|---|---|---|---|---|
| පාසැල් අධ්‍යාපනය මග හැරුණු හා අඩු අධ්‍යාපනය ලබන පිරිස සඳහා වෘත්තීය කුසලතාවය අවම වීම . | තරුණ තරුණියන්ගේ වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම. | වෘත්තිය පුහුණුව නොමැති අය වෘත්තිය පුහුණුවකට යොමු කිරීම. | වසම තුළ ඇති වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන සඳහා යොමු කිරීම.<br><br>දෙ/බටහිර වසම තුළ ඇති වෘත්තිය මධ්‍යස්ථාන - **දෙ/ග නගර සභාව මගින් සිදුකරන දෙ/මධ්‍ය පුස්තකාලයේ පැවැත්වෙන තොරතුරු සන්නිවේදන පුහුණු පාඨමාලාව** සති අන්තයේ දී කාණ්ඩ 03ක ට ක්‍රියාත්මක කෙරේ. නොමිලේ සිදු කරන අතර, | පඨමාලා කාලය 06 | 65 | නිපුණතා සංවර්ධන නිලධාරි<br><br>මානව සම්පත් නිලධාරි<br><br>විදාතා හා තාක්ෂණ නිලධාරි |
| න්‍යාය හා ප්‍රායෝගික පුහුණුව අවම වීම. | පාරම්පරික වෘත්තින්වල නිරත පිරිස් සඳහා න්‍යාය හා ප්‍රායෝගික දැනුම වර්ධනය කිරීම. | වෘත්තින්හි නවදැනුම තාක්ෂණය වර්තමානයට ගැළපෙන ලෙස යාවත්කාලී කිරීම. | A/L, O/L සිසුන්ගේ තොරතුරු තාක්ෂණ විෂය ඉහළ නැංවීම සඳහා මෙම පාඨමාලාව සිදු කරනු ලබයි.<br><br>**තෘතිය හා වෘත්තිය අධ්‍යාපන ආයතනයෙන් සිදු කරන ඡයාරූපගත පාඨමාලාව**<br>ස්ථානය - ආනන්ද ධර්මරාජ විහාරය, ගාලුපාර, දෙහිවල<br>මුදල් අය කර ගනී<br>ඉරිදා උදේ කාලයේ දී පුහුණු පාඨමාලා පැවැත්වේ.<br>වයස් කාණ්ඩයක් නොමැත. | පඨමාලා කාලය 06 | 25 | |

## 07.ජීවනෝපාය හා ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබල කරන සැලැස්ම.

| ගැටලුව | අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | කාලය | ප්‍රතිලාභි පවුල් | වගකීම |
|---|---|---|---|---|---|---|
| ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති නිසා සමාජ ආර්ථික ගැටලුවලින් පිඩා විදීම. | ප්‍රජාවගෙ ආදයම් මට්ටම ඉහළ නැංවීම. | අදායම් උත්පාදන මාර්ග ප්‍රජාව වැඩි කිරීමට ස්වයං රැකියා සඳහා යොමු කිරීම. | • වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම.<br>• කුඩා ව්‍යාපාර සංවර්ධන නිලාධාරි හරහා ණය පහසුකම් ලබාදීමට යොමු කිරීම.<br>• පෞද්ගලික හා රාජ්‍ය අංශයේ රැකියා ලබාදීම.<br>• සහන පොළියට ණය ලබාදීම.<br>• රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොයන ආයතන සම්බන්ධ කිරීම.<br>• දෙහිවල බටහිර වසම තුළ එක්සත් කාන්තා සමිතියක් ඇත. කාන්තා සමිතිය මගින් කාන්තාවන් ස්වයංරැකියාවලට යොමුකිරීම සිදුකරන අතර, වරින් වර ප්‍රජාව දිරිගැන්වීම සිදුකරයි.<br>• **වසම තුළ ස්වයංරැකියාලාභීන් සඳහා හඳුනාගත් ගැටලු**<br>• මැහුම් සඳහා ඇනවුම් නොමැති වීම<br>• ව්‍යාපාර දියුණු කිරීමට මුදල් හා වෙළඳපොලක් නොමැති වීම. | මසකට වතාවක්<br><br>මාස 03 | කාන්තා සමිති සමාජිකයින් 22<br><br>08 | කාන්තා කටයුතු නිලධාරි<br><br>මානව සම්පත් නිලධාරි<br><br>විදාතා හා තාක්ෂණ නිලධාරි<br><br>කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි<br><br>සමෘද්ධි සංවර්ධන නිලධාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නිෂ්පාදන සදහා වෙළදපොල ධාරිතාව අවම වීම.<br><br>සංචාරක කර්මාන්තය අඩපණ වීම නිසා ඒ | පුළුල් නිෂ්පාදන වෙළදපොලක් සැකසීම.<br><br>සංචාරක කර්මාන්තය නගා සිටුවීම. | විදාතා හා තාක්ෂණ මධ්‍යස්ථාන සම්බන්ධ කරගෙන පුහුණු අවස්ථා වැඩි කරගැනීම.<br><br>ග්‍රාම සංවර්ධන අමාත්‍යංශ මැහුම් උපදේශිකා හරහා මැහුම් පුහුණු පාඨමාලා ලබාදීම.<br><br>කුඩා ව්‍යපාර නිලධාරි හරහා ව්‍යාපාර ආරම්භ කිරීමට පුහුණුව ලබාදීම.<br><br>සංචාරක අමත්‍යංශය දෙ/ග නගර සභාව හා ප්‍රා.ලේ.කා යම් | • තරගකාරි නිෂ්පාදන රටාවක් වෙළදපොළට හදුන්වාදීමට විදාතා හා තාක්ෂණ මධ්‍යස්ථාන හරහා මාසික එක් එක් වැඩසටහන් මගින් පුහුණුවීම් කටයුතු සිදු කරයි.<br><br>• දෙහිවල උද්‍යාන වසමේ ගැමුණු ප්‍රජාශාලාවේ වසම්වල ගෘහනියන් ශක්තිමත් කිරීම සදහා මැහුම් පාඨමාලාවන් ක්‍රියාත්මක කරනු ලබයි. (එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම් ) ගෘහණියන් සදහා පූර්ණ කාලීන කෙටිවැඩසටහන්, වයස් සීමාවකින් තොරව සිදු කරයි.<br><br>• පුහුණු උපකරණ හා අමුද්‍රව්‍ය ලබාදීම.<br><br>• නිෂ්පාදන අලෙවිකිරීමට වෙළදපොලක් සපයා දීම.<br><br>• කුඩා ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තු මගින් ව්‍යවසායකයන්ට මුල්‍ය ණය පහසුකම් ලබාගැනීමේ දී බැංකුවට අවශ්‍ය ව්‍යපාර සැලැස්ම සදාගැනීමට පුහුණුවීම් හා මුල්‍ය ණය දීම සිදුකරයි.<br><br>• සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආයතන වලින් බදු මුදල් අඩු කරගැනීම. | | 12 | ග්‍රාම සංවර්ධන අමාත්‍යංශ නිලධාරි<br><br>විදාතා තාක්ෂණ නිලධාරි<br><br>ග්‍රාම නිලධාරි<br><br>සංවර්ධන නිලධාරි<br><br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br><br>කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආශ්‍රිත රැකියා විරහිත වීමේ අවදානක් ඇත.<br><br><br>ධීවර කර්මාන්තයේ නියැලැන්නගේ ජීවිත අවදානම හා උපකරණ හිගය. | ජීවිත සුරක්ෂිත වීම | කුවේදයක් සකස් කිරීම.<br><br><br>වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරින් හා සමුද්‍ර සංරක්ෂණ දෙපාර්තමේන්තු හා ධීවර සමිති සමග ක්‍රියාමාර්ග ගැනීම. | • රාජ්‍ය මැදිහත් වීම් මත ප්‍රවර්ධන වැඩසටහන් සඳහා යොමු කිරීම.<br>දෙ/බටහිර වසම තුළ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව බොහෝ පිරිසක් ජීවනෝපාය කටයුතු සිදුකරයි. කොරෝනා රෝගය නිසා අද වන විට local tourist 70% අඩුවීමක් හා foreign tourist 80%ක අඩු වීමක් ඇත. ඔවුනගේ බදු මුදලට සරිලන ආදායමක් නැත.<br>දෙ/බ වසම තුළ කිම්දි විසිතුරු මසුන් අල්ලන්ගෙ සමුපකාර සමිතිය මගින් කිම්දුම්කරුවන්ගේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය සිදු කරයි. එම සමිතිය හරහා ධීවරයන්ගේ ජීවනෝපාය ශක්තිමත් කිරීමට අවශ්‍ය භාණ්ඩ ලබාදීම සිදු කරයි.<br>**ධීවර ප්‍රජාවට අවශ්‍ය ද්‍රව්‍ය**<br>ලාම්පුතෙල්<br>හිනි දැල් 2 ½<br>6 වෙළුම<br>12 වෙළුම<br>15 වෙළුම<br>දෙහිවල බටහිර වසම තුළ ධීවර ප්‍රජාවට බලපාන ප්‍රධාන කරුණක් නම් " කඩමත්ත" නිසා ජීවිතහානි නිතර සිදුවීම. කඩමත්ත දෙපැත්තෙ ගල්පර නිසා බෝට්ටු යන මාර්ගය පටුය. මුහුදු රළ වැඩි අවස්ථාවක දී බෝට්ටුව ගල්පර වැදීමෙන් බෝට්ටු පෙරළීමට ඉඩකඩ වැඩිය. ඒ තුළින් ජීවිත හානි බොහෝමය<br>ක් දැනට සිදු වී ඇත. දෙහිවල ධීවර ප්‍රජාව විසින් ඉල්ලුම් කරන්නෙ කඩමත්ත කඩල බැම්මක් දැමීම | | | |

## 08.කෘෂිකාර්මික සැලැස්ම

| ගැටලුව | අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | කාලය | ප්‍රතිලාභී පවුල් | වගකීම |
|---|---|---|---|---|---|---|
| ගෙවතු වගා සඳහා නාගරික ප්‍රදේශයේ ප්‍රමාණවත් ඉඩකඩ නොමැති වීම. | නිවාස සංකීර්ණ සිටින අය සඳහා ගෙවතු වගා සම්බන්ධ කිරීම. | වගා සම්බන්ද දැනුම ඇති නිලධාරීන් හා ආයතන සම්පත් දායකයින් සම්බන්ධ කරගැනීම. | • දෙ/බටහිර වසම තුළ නිවාස සංකීර්ණ 72 ක් වැනි විශාල සංඛ්‍යාවක් තිබීමත්, ඒවායේ විශාල පවුල් ගණනක් ජීවත් වේ. ඉඩකඩ නොමැතිකමින් වගා කටයුතු නිරත වීම අපහසුය. එහෙත් ඉඩ සීමිත ප්‍රමාණයක් හෝ තිබෙන ප්‍රජාවට ගැලපෙන වගා ක්‍රම හඳුන්වා දිය යුතුය.<br>• තිරස් වගා ක්‍රම<br>• බඳුන් වර්ගවල<br>• බොන්සායි ක්‍රමයට වගා කිරීම<br>• වැහැපිලි නව තාක්ෂණික දැනුම දිය යුතුය.<br>• ගෙවතු වගා කරුවන් හඳුනාගෙන ගෙවතු වගා සම්බන්ධව රෝග නිවාරණ උපක්‍රම, පොහොර භාවිතය හා වගා නඩත්තු ක්‍රම සම්බන්ධව ශිල්පීය දැනුම ලබාදීම. | මාස 03 | දැනට ගෙවතු වගා කරුවන් 32 | කෘෂිපර්යේෂණ සහකාර නිලධාරි<br><br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br><br>සංවර්ධන නිලධාරි<br><br>ග්‍රාම නිලධාරි |
| ගෙවතු වගා සඳහා බීජ වර්ග නොමැති වීම. | නාගරික ප්‍රජාව අතර, ගෙවතු වගාව වර්ධනය කිරීම. | නාගරික ප්‍රජාවට අවම ඉඩකඩකින් වැඩි ඵලදායිතාවයක් සහිතව වගාක්‍රමයක් සහ බෝග වර්ග හඳුන්වා දීම. | • වැඩි ඵලදාවකින් යුත් දෙමුහුම් බීජ වර්ග හඳුන්වා දීම.<br>• අන්තර්ජාලය හරහා ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් වැඩි ඵලදාවක් ලබාදෙන බීජවර්ග නිවෙස්වලට ගෙන්වා ගැනීමට ක්‍රමපෝයාන් සකස් කිරීම.<br>• කෘෂි සංවර්ධන හා උපදේශකවරුන් හරහා කෘෂි සංවර්ධන වැඩසටහන් දියත් කිරීම | | | |

## 09.පරිසර කළමණාකරන සැලැස්ම

| ගැටලුව | අරමුණ | උපාය මාර්ග | ක්‍රියාකාරකම් | කාලය | ප්‍රතිලාභී පවුල් | වගකීම |
|---|---|---|---|---|---|---|
| අවිධිමත් ලෙස කැළි කසල බැහැර කිරීම | අපද්‍රව්‍ය කැලි කසල කළමනාකරණය | නගර සභාව හරහා පරිසර හිතකාමීව කැලි කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. | • කැලි කසල නිසි ලෙස ප්‍රමිතිගත කර බදුන් ගත කිරීම.<br>• නැවත පරිහරණය කළ හැකි අපද්‍රව්‍ය විකුණා මුදල් උපයාගැනීමට සැලැස්වීම. | දිනපතා | 1947 | දෙ/ග නගර සභාව |
| කසල බැහැර කරන ස්ථානයක් නොමැති වීම. නිවෙස් සඳහා භූමි ප්‍රමාණයක් නොමැති වීම. | | | • නිවස තුළට කසල ප්‍රතිචක්‍රිකරණය කල හැකි බදුන් ලබාදීම.<br>• ECO BRICK නව ක්‍රමවේදයකට උචිත ලෙස කසල බැහැර කිරීම. | මාස 01 | 1947 | දෙ/ග නගර සභාව |
| දෙහිවල බටහිර වසමේ වාසල පාරේ ඇළෙන් හා අල්විස් පෙදෙසෙ හි ඇති මහ කාණුවෙන් මුහුදට කැලි කසල එකතුවීමෙන් වෙරළ තීරය අපවිත්‍ර වීම. | වෙරළ පිරිසිදුව තබාගැනීම | නගර සභාව, පහත්බිම් සංවර්ධන මණ්ඩලය, වෙරළ සංරක්ෂණ ආයතන සමග කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම. | • වෙරළ තීරයෙහි තැනින් තැන කසල බදුන් තැබීම.<br>• කසල දමන්නහට දඩුවම් දීම.<br>• අල්විස් පෙදෙසෙහි මහ කාණුවෙන් එකතුවන කැළි කසල නිසි ක්‍රමවේදයක් හරහා මුහදට මුදා හැරිය යුතුය.<br>• වාසල ඇළට දමන කුණු පහත්බිම් සංවර්ධන මණ්ඩලය මගින් දිනපතා ඉවත් කල යුතුය. | සති 02 කට සැරයක්<br>දිනපතා | කුණු දමන නිවාස 865<br>ඇළට කුණු දමන පවුල් 485 | දෙ/ග නගර සභාව<br>පහත්බිම් සංවර්ධන මණ්ඩලය<br>දෙ/ග නගර සභාව<br>දෙ/ග නගර සභාව |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| නියමිත පරිදි කසල ප්‍රවාහනය නොකිරීම. | විධිමත් පරිදි කසල ප්‍රවාහනයට වැඩ පිළිවෙලක් සකස් කිරීම. | දෙ/ග නගර සභාවේ පවිත්‍රතා අංශය සමග සාකච්ඡා කර වැඩපිළිවෙලක් සකස් කිරීම. | • නගර සභාව හා අදාල ප්‍රදේශයේ ප්‍රජාව සමග සාකච්ඡා කර එදිනෙදා රැගෙන යන ද්‍රව්‍ය , කුණු රැගෙන යන දින පිළිබඳව ජනතාවට අවබෝධයක් ලබාදීම.<br>• කසල වර්ගීකරණය පිළිබඳව ප්‍රජාව නිවැරදි ලෙස දැනුවත් කිරීම. | දිනප තා | 1947 | දෙ/ග නගර සභාව |
| වර්ෂාකාලයේදී ස්වභාවික විපත් ඇති වීම. | නිවාස හා දේපල , මාර්ග වලට සිදුවන හානි අවම කරගැනීම. | වර්ෂා ජලය විධිමත් පරිදි බැසයන ක්‍රමවේදයක් සැලැස්වීම. | • මහ නගර සභාවේ කාණු පිරිසිදු කිරීමේ අංශය සම්බන්ධ කරගෙන වසමේ ඇති සියලුම කාණු ශුද්ධ පවිත්‍ර කිරීම.<br>• අල්විස් පාර<br>• වැන්ඩවට් පාර<br>• පීටර්ස් පාර<br>• 2 වන පටුමග<br>• රමනාදන් මාවත<br>• කැම්බල් පෙදෙස<br>• ප්‍රේෂර් ඇවනියු<br>• නිමන්ත රාජපක්ෂ මාවත<br>• පෙරේරා මාවත කාණු ශුද්ධ කිරීමේ දී ප්‍රමුඛතාවය දිය යුතු මාවත් වේ.<br>• කාණු ශුද්ධ පවිත්‍ර නොකිරීමෙන් සුළු | සතිය කට සැරය ක් | 1947 | අපදා කළමනාකරණ නිලධාරි<br><br>ග්‍රාම නිලධාරි<br><br>සමෘද්ධි සංවර්ධන නිලධාරි<br><br>සංවර්ධන නිලධාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | වැස්සක දී වුවද නිවාස කිහිපයකට වතුර දමයි. | | | |
| අවිධිමත් ඉදිකිරීම් නිසා පාරිසරික ගැටලු ඇතිවීම. | ස්වභාවික වෙරළ තීරයේ අනවසර ඉදිකිරීම් අවම කිරීම. | දෙ/ග නගර සභාව ප්‍රා.ලේ. කා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සංචාරක අමාත්‍යාංශය දුම්රිය දෙපාර්තමේන්තුව මගින් .සැලැස්මක් සකස් කිරීම. | • නව ඉදිකිරීම් සදහා අනුමැතිය නොදීම.<br>• නීතිවිරෝධි ඉදිකිරීම් නගර සභාව හරහා අධිකරණ ක්‍රියාවලියකට යොමු කිරීම.<br>• ජලය, විදුලිය, සංචාරක බලපත්‍ර නොදීම.<br>• නිවාස අහිමි අයට මහල් නිවාස ලබාදීම. අඩු භූමි ප්‍රමාණයකින් වැඩි නිවාස ප්‍රමාණයක් ලබාදීම.<br>• දෙහිවල බටහිර වෙරළ ආශ්‍රිතව අනවසර නිවාස හා ව්‍යාපාරික ස්ථාන කිහිපයක් දැකිය හැක.<br>**වෙරළ තීරයෙහි පිහිටා ඇති නිවාස**<br>එස්. සුමිත්‍රා - 55/13<br>ටී.එච්. කෝසලා උදයංගනි - 58/13<br>එම්. සුමුදිකා මධුෂානි - 58/13<br>හිමාෂා දිල්හානි - 58/13<br>ආඩි මුඩියාඩි - 55/3<br>ඩබ්.ඒ.ඩී සුජීවා -<br><br>**වෙරළ තීරයෙහි පිහිටා ඇති ව්‍යාපාරික ස්ථාන**<br>බැරකුඩා රෙස්ටුරන්ට් - 41/2 වාසල පාර<br>කැන්ලංකා බීච් රෙස්ටුරන්ට්- රාමනාදන් පාර<br>සන්සෙට් බීච් වාසිය - ඇල්බට් පෙදෙස | අවු 01 | 250 | වෙරළ සංරක්ෂණ නිලධාරි<br><br>දෙ/ග නගර සභාව<br><br>නිවාස නිලධාරි<br><br>ග්‍රාම නිලධාරි |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ලැනී ප්ලේස් - නො. 39 වැන්ඩවට් පෙදෙස<br>සී වේව් රෙස්ටුරන්ට් - 41/3 වාසල පාර<br>ගෝල්ඩන් බීච් - කැම්බල් පෙදෙස<br>ද ඩෙක් - පීටර්ස් පටුමග<br>අයිලන්ඩ් ස්කුබා - අල්විස් පාර | | | |
| ඩෙංගු උවදුර උත්සන්න වීම. | වසම තුළ ඩෙංගු මදුරුවන් බෝවීමේ ව්‍යාප්තිය අඩුකර ගැනීම. | දෙ/ග මහජන සෞඛ්‍ය කාර්යාලය සෞඛ්‍ය අමාත්‍යාංශය ඩෙංගු මර්දන ඒකකය<br>වසමෙ ඇති සිවිල් කමිටු සමග වැඩපිළිවෙලක් සකස් කිරීම. | • වීදි කමිටු සක්‍රිය කිරීම.<br>• පොදු ස්ථාන පිරිසිදු කිරීම<br>• අත්පත්‍රිකා දීම, ගෙයින් ගෙට ගොස් පරීක්ෂා කිරීම.<br>• සතියකට වතාවත් වසමෙ ඇති කාණු පිරිසිදු කිරීම.<br>• ප්ලාස්ටික් අපද්‍රව්‍ය මිල දී ගන්නා ආයතන සම්බන්ධ කිරීම.<br>• දුම්මානය කිරීම<br>• දෙහිවල බටහිර වසම තුළMarine drive එකට වෙන් වූ හිස් ඉඩම් කිහිපයක් තිබීම නිසා මදුරුවන් බෝවීමේ ඉඩකඩ වැඩි වී ඇත. (වැන්ඩවට් පෙදෙසෙ නො 44, 55) හිස් ඉඩම් වල තැනින් තැන විශාල වශයෙ න් අබලන් වූ ද්‍රව්‍ය ඉවත් කරන ලද ගොඩනැගිලි ද්‍රව්‍ය, කැලි කසල, ප්ලාස්ටික් බෝතල් ආදිය දැකිය හැක. ඒවායෙහි වතුර රැඳිම නිසා මදුරුවන් බෝවීමේ ප්‍රවණතාවය වැඩිය.<br>• නිමන්ත රාජපක්ෂ මාවතේ 120/1 හිස් | සතිය කට සැරය ක් | 1947 | දෙ/ග නගර සභාව<br>ප්‍රා.ලේ. කාර්යාලය<br>සිවිල් ආරක්ෂක කමිටු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ඉඩමක් ඇත. ශුද්ධ පවිත්‍ර නොකිරීම නිසා මදුරුවන් බෝවීමේ ඉඩකඩ ඇත. | | | |
| වසම තුළ පරිසරයේ අලංකාරය වැඩිකරගැනීමට හැකි ස්ථානවලට උද්‍යාන සැලසුම් නොමැති වීම. | පරිසරය අලංකාර කර ගැනීම. | පහත්බිම් සංවර්ධන අධිකාරිය<br>පරිසර අමාත්‍යාංශය<br>දෙ/ග නගර සභාව හරහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම. | • දෙ/බටහිර වසම තුළ වාසල ඇළ මාර්ගයේ හරිත උද්‍යාන සෑදීම. ඒ තුළින් එම ප්‍රදේශය තුළ සංචාරකයන් නිතර ගැවසෙන නිසා සංචාරක ආකාර්ෂණය ඉතාමත් ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට හැකිය. | අවු.01 | 2000 | දෙ/ග නගර සභාව<br><br>නාගරික සංවර්ධන අධිකාරිය |